# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 75 දරන මහින්දානන්ද අළුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 දෙසැම්බර් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 6.00 යි. **තැපැල් ගාස්තුව :** රු. 5.00 යි.

**2009 අංක 75 දරන මහින්දානන්ද අළුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 3/2009.

**මහින්දානන්ද අළුත්ගමගේ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"මහින්දානන්ද අළුත්ගමගේ පදනම" යනුවෙන් හඳුන්වනු ලැබූ හා ප්‍රකට පදනමක්, එකී පදනමේ සියලු අරමුණු හා එම පදනම හා සම්බන්ධ සියලු කාරණා සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා ගෙන තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලද්දේ යම් අරමුණු හා කාරණා සඳහා ද, එම අරමුණු හා කාරණා එම පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරවා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 75 දරන "මහින්දානන්ද අළුත්ගමගේ පදනම" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) මහින්දානන්ද අළුත්ගමගේ පදනමේ දැනට සාමාජිකයන්ව සිටින හා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මහින්දානන්ද අළුත්ගමගේ පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. තව ද, එකී සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද, එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය. මහින්දානන්ද අළුත්ගමගේ පදනම සංස්ථාගත කිරීම

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලැබුවේ යම් පොදු පරමාර්ථ සඳහා ද එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

2—PL 004440—2,650 (2009/10)

(අ) අගහිඟකම් ඇති පාසල් සිසුන්ට තම අධ්‍යාපන කටයුතු දිගටම පවත්වාගෙන යෑමට හැකිවන පරිදි හා ඔවුන් නිතිපතා පාසල් යෑම දිරිමත් කිරීම සඳහා ඔවුනට ත්‍යාග සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ආ) සිසුන්ට සිය අධ්‍යාපන කටයුතුවලට සහාය ලබා දීම සඳහා ජංගම පුස්තකාල ඇතුළු පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යෑම;

(ඇ) පාසල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අදහස ඇතිව සංවර්ධන වැඩමුළු, දේශන, ප්‍රදර්ශන සහ අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම;

(ඈ) විදුහල්පතිවරුන්ගේ සහ ගුරුවරුන්ගේ වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීම සඳහා ඔවුන් දිරිමත් කිරීම පිණිස පාසල් විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට ණය යෝජනා ක්‍රම සහ වෙනත් සහාය ලබා දීම;

(ඉ) විශ්වවිද්‍යාල හා කාර්මික විද්‍යාලවල පාඨමාලා හැදෑරීම සඳහා තෝරාගෙන ඇති අගහිඟකම් ඇති සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම;

(ඊ) පාසල් හැර යන්නන්ට ස්වයංරැකියා අවස්ථා හඳුන්වා දීම, ණය සහ ඉතිරි කිරීමේ යෝජනා ක්‍රම සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ පරිගණක පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම;

(උ) අගහිඟකම් ඇති ළමයින්ගේ කුඩා කල ළමා සංවර්ධනය සඳහා පෙර පාසල් පිහිටුවීම හා පවත්වාගෙන යාම;

(ඌ) ඉඩම් හෝ නිවාස නොමැති අගහිඟකම් ඇති පවුල්වලට ඉඩම් සහ නිවාස ප්‍රදානය කිරීම;

(එ) රෝහල් සඳහා රෝද පුටු ඇතුළු අනෙකුත් වෛද්‍ය උපකරණ ලබා දීම සහ අගහිඟකම් ඇති අසරණ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය සහන සහ ආහාර ලබා දීම, අවතැන් වූ පුද්ගලයන්ට සහ වැඩිහිටියන් සඳහා නිවාස පිහිටුවා පවත්වාගෙන යාම සහ ළමයින් හා වැඩිහිටියන් සඳහා ළමා නිවාස සහ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම;

(ඒ) සංස්ථාවේ අරමුණු පිළිබඳ තොරතුරු ව්‍යාප්ත කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි පොත්පත්, සඟරා, වාර සඟරා සහ පුවත්පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම ; සහ

(ඔ) අන්ධ, බිහිරි සහ ගොළු තැනැත්තන්ගේ අවශ්‍යතා සඳහා විධිවිධාන සලසමින් ඔවුන්ට ආධාර කිරීම.

4. (1) සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන වෙනත් සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත වන අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට සහ මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු පාලනය කිරීම.

(2) සංස්ථාවේ ප්‍රාරම්භක සාමාජිකයා වන ගරු අමාත්‍ය මහින්දානන්ද අළුත්ගමගේ, සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

(අ) සංස්ථාවේ අරමුණු සඳහා ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ලබා ගැනීම සහ එකතු කිරීම;

(ආ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට, සංස්ථාවට අයත් අරමුදල් ආයෝජනය කිරීම;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කවර හෝ බැංකුවක හෝ බැංකුවල ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යෑම සහ ගිණුම් වැසීම;

(ඈ) සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයේ නියුක්ත කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම;

(ඉ) සමාන අරමුණු ඇති දේශීය සහ විදේශීය ආයතන සමග සබඳතා ඇතිකර ගැනීම සහ සම්බන්ධීකරණය ;

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින්, කලින් කල, යම් වාර්ෂික මහ සභා රැස්වීමක දී හෝ විශේෂ මහ සභා රැස්වීමක දී හෝ මෙහි පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය .

(අ) නිලතල දරන්නන් සහ ඔවුන්ගේ ධුර කාලය, සේවයෙන් අස් වීම, ඉවත් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල හා කාර්ය;

(ආ) නිලතල දරන්නන් හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ ධුර කාලය සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය;

(ඇ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්කර ගැනීම, නෙරපීම සහ සාමාජිකත්ව ගාස්තු;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වා ගැනීම හා විගණනය;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමක දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සහ එහි ගණපූරණය සහ එහි දී කටයුතු කළ යුතු ආකාරය ; සහ

(ඊ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි අරමුණු ඉටු කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන සෑම රීතියක්ම (1) වන උපවගන්තියේ දක්වා ඇති පරිදි වූ රැස්වීමක දී, ඒ හා සමාන ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

7. මිලදී ගැනීමෙන්, ප්‍රදානයකින්, තෑගි කිරීමකින් හෝ තෙස්තමේන්තු නියාදනයකින් හෝ අන්‍යාකාරයකින් කවර හෝ චංචල සහ නිශ්චල දේපළ අත්කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙහිලා බලය හා හැකියාව ඇති අතර, ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමට පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා, මේ පනතේ විධිවිධාන සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව එම දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සම්මාදම්, ආධාර මුදල් හෝ ප්‍රදාන වශයෙන් මින් පෙර හෝ මින්මතු ලැබෙන සියලු මුදල් සංස්ථාවේ අරමුදල වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව විසින් මේ පනත යටතේ එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්, සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය හා පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම් සීමිත බව.

10. සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ වගකීම් බේරුම් කිරීම හෝ වෙනත් යම් කාර්යයක් සඳහා එවැනි සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජිකත්ව ගාස්තුව ඉක්මවා යම් සම්මාදමක් කිරීමට යටත් නොවිය යුතු ය.

ගිණුම් විගණනය.

11. (1) සංස්ථාව විසින් එහි සියලු ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු ලවා විගණනය කරවා ගනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද, එම සංස්ථාව විසින් නිකුත් කරන ලද ගණකාධිකාරීවරයකු ලෙස සේවයේ යෙදීමේ සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) එක් එක් නේවාසික කොටස්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතිය මගින් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු ලෙස සේවයේ යෙදීම සඳහා එම සංස්ථාව විසින් නිකුත් කරන ලද සහතිකයක සන්තකය දරන්නා වූ ද, ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

12. සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර, එකී සාමාජිකයන් විසින් ඔවුන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් සාධන පත්‍රයෙහි ඔවුන්ගේ නම් අත්සන් කළ යුතු ය. ඔවුන් විසින් එසේ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

13. සංස්ථාව විසුරුවා හැරීමේදී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර,

සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, 6 වන වගන්තිය යටතේ සාදන ලද රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් සුරැකීම.

14. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.